**සීමාසහිත කැනොවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (පෞද්ගලික) සමාගම - 2016**

**-----------------------------------------------------------------------------------------------**

සීමාසහිත කැනොවින් **හොටේල්ස්** ඇන්ඩ් ස්පාස් (පෞද්ගලික) සමාගමෙහි ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා මා විසින් ප්‍රසිද්ධ පරිචයෙහි යෙදෙන වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලබාගන්නා ලදී.

මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීමඋදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත කැනොවින් **හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (පෞද්ගලික)** සමාගමෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු වාර්තා කරනු ලැබේ.

(අ) මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය හා සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ:

- විගණනයේදී අවශ්‍ය වූ සියළු තොරතුරු සහ පැහැදිලිකරවා ගැනීම් මා විසින් ලබාගෙන ඇති බවත් මාගේ පරීක්ෂණ වලදී පෙනී ගිය ආකාරයට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන **2007** අංක **07** දරන සමාගම පනතේ **151** වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත්ය.

### 2.2 ලැබිය යුතු ගිණුම්

-----------------

දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි පිහිටි වැලිපැන්න විවේක මධ්‍යස්ථානයෙහි සමාගම විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳ කුටි සහ බාහිර සේවා සැපයීම් වලින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.26,726,886 ක් වූ අතර එම ආදායම අයකර ගැනීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාගමේ කළමනාකරණය අපොහොසත් වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. ඉන් රු.9,751,361 ක මුදලක් දින 90 කට වැඩි කාලයක් හිඟහිට පැවතුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.19,490,987 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අතිරික්තය රු. 30,228,564 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,737,577ක පිරිහීමක් දැක්වුණි. රු.5,148,495 කින් පරිපාලන වියදම් වැඩිවීම හා ආයෝජන වත්කම්වල සාධාරණ අගය වෙනස්වීමෙන් ඇති වූ රු.10,690,248 ක ශුද්ධ අලාභයට ප්‍රතිරූපව ආදායම සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.3,980,285 ක් සහ රු.2,869,535 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වැලිපැන්න විවේක මධ්‍යස්ථාන 02 හි අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය**

---

වැලිපැන්න විවේක මධ්‍යස්ථාන 2 හි එකතු වූ අප ජලය ගලි බවුසර් භාවිතයෙන් බැහැර කිරීම වෙනුවෙන් 2015 සිට 2017 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමාගම විසින් පෞද්ගලික ආයතන 06 ක් වෙත රු.16,779,146 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

- අප ජලය බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආයතන වෙත නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ආයතන 06 ක් වෙත ප්‍රදානය කර තිබුණි.

- අප ජලය බැහැර කිරීම සඳහා ඉදිරිපත් වූ ආයතන 02 ක් පමණක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් සොයිසාපුර හා ජයවඩනගම පිහිටි පිරිපහදු කිරීමේ මධ්‍යස්ථාන වෙත ඔවුන් විසින් එකතු කරන ලද අප ජලය භාරදී තිබුණි. කෙසේ වෙතත් ඉහත කාල පරිච්ඡේදය තුළ අනෙක් ආයතන 4 විසින් එකතුකළ ලීටර් 5,265,878 ක් වූ අප ජලය පරිසර හිතකාමී අයුරින් බැහැරකළේද යන්න පිළිබඳව තහවුරු කර ගැනීමට නොහැකි විය.

- අප ජලය බැහැර කිරීම සඳහා ගලි බවුසර් දෙකක් (අංක LL 2878 සහ අංක LL 1830) යොදවා තිබූ අතර සොයිසාපුර පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් අප ජලය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය සතුව පැවති සහතික කරන ලද තොරතුරු අනුව මෙම බවුසර් 02හි ධාරිතාවය පිළිවෙළින් ලීටර් 13,000 ක් සහ ලීටර් 15,000 ක් විය. කෙසේ වුවද ධාරිතාවය පිළිවෙලින් ලීටර් 15,000 සහ ලීටර් 16,000 ක් වශයෙන් සැලකිල්ලට ගෙන ගෙවීම් සිදු කර තිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත රු.914, 938 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ආ) අප ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය**

---

වැලිපැන්න විවේක මධ්‍යස්ථාන 02 හි අප ජලය පිරිපහදු කර ගෙවතු වගාව සහ වැසිකිළි ජල මුද්‍රණය සඳහා මුදා හැරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් 2015 අප්‍රේල් 08 දින සමාගම විසින් කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුමකට එළඹ තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) රු. 35,011,665 ක පිරිවැයක් දරමින් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර **2015** අගෝස්තු **26** දින සමාගම වෙත භාරදී තිබුණද, ව්‍යාපෘතිය පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා සුදුසු තත්ත්වය නොතිබීම හේතුවෙන් එදින සිට 2016 මැයි **09** දින දක්වා ගලි බවුසර් භාවිතයෙන් අප ජලය ඉවත් කිරීම වෙනුවෙන් රු.6,323,175 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) ඉහත කාර්ය සඳහා සුදුසු මිල කැඳවීමේ ක්‍රමයක් අනුගමනය කරමින් මිල ගණන් කැඳවා නොතිබුණි. තවද මෙම කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොතිබුණි.

**4.2** **මතභේදයට තුඩුදෙන කරුණු**

---

2015 වර්ෂයේදී රු.1,989,489 ක පිරිවැයක් දරමින් අධිවේගී මාර්ගය දෙපස ස්ථාපිත කරන ලද නාම පුවරු දෙකක් 2016 පෙබරවාරි මාසයේදී රු.720,000 ක මුදලක් වැය කරමින් අළුත්වැඩියා කර තිබුණි. මෙම කාර්යය සඳහා ආයතන හතරක් විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් මෙම කාර්යය සඳහා තෝරාගත් ආයතනය හැර මිල ගණන් ඉදිරිපත් කරන ලද අනෙක් ආයතන තුන ලබා දී ඇති ලිපිනයන්හි ස්ථානගත කර නොතිබුණි.

**4.3** **කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා**

---

රු.5,929,754 ක් වැය කරමින් වැලිපැන්න විවේක මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කර තිබුණු CCTV කැමරා පද්ධතිය 2016 වර්ෂයේදී රු.2,460,950 ක් වැය කරමින් අළුත්වැඩියා සහ නවීකරණය කර තිබුණි. වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් එහි අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද ‍වෝහාරික විගණන වාර්තාවට අනුව පහත සඳහන් නිරීක්ෂණ අනාවරණය විය.

i. මෙම අළුත්වැඩියා කටයුතු සඳහා තෝරාගන්නා ලද සැපයුම්කරු සහ මිල ගණන් ඉදිරිපත් කරන ලද තවත් ආයතනයක් සමාගමේ සම්බන්ධිත සමාගම් වේ.

ii. මිල ගණන් ඉදිරිපත් කරන ලද තවත් ආයතනයක් තෝරාගත් සැපයුම්කරුගේ සේවකයෙකුට අයත් ආයතනයක් වන අතර මිල ගණන් සමග ඉදිරිපත් කර තිබුණු ලිපිනය පිළිබඳ කරන ලද පරීක්ෂාවකට අනුව එය හාත්පසින්ම වෙනත් ව්‍යාපාරික කටයුත්තක් කරනු ලබන ස්ථානයක් විය.

iii. ඉදිරිපත් කරන ලද සියළු මිල ගණන් අසත්‍ය සහ අධ්‍යක්ෂ මණ්ඩලය නොමග යවන සුළු ස්වභාවයෙන් යුතු විය.

iv. ඉහත වාර්තාවේ දැක්වෙන කරුණු අනුව, මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ පහත දැක්වෙන විධිවිධාන සමග අනුකූල වීමට අපොහොසත් වී තිබුණි.

- උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීමේදී ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සලසා ගැනීම, නිසිකලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රසම්පාදන කටයුතු කිරීම.
- නියමිත ප්‍රමිතීන්ට, පිරිවිතරවලට, රීතිවලට, රෙගුලාසිවලට සහ යහපත් පාලනයට අනුකූලව කටයුතු කිරීම.
- සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සහභාගිවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීම.
- ඇගයීමේ සහ තේරීම් කාර්ය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික වීම.

**5.** **පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| **(අ)** ලදුපත් නිකුත් කිරීම පිළිබඳ පාලනය | ලදුපත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව සිදු නොකිරීම. |
| (ආ) ගෙවීම් සම්බන්ධ පාලනය | බලය දීම සම්බන්ධයෙන් සමාගම විසින් බලය පැවරීම් ස්ථාපිත කර තිබුණද, ඇතැම් අවස්ථාවලදී ගෙවීම් වවුචර්පත් සඳහා බලයදීම සිදුකර නොතිබුණි. |